# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2232/5 - 2021 ජුනි මස 14 වැනි සඳුදා - 2021.06.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2017 අංක 24 දරන දේශීය ආදායම් පනත**

2021 අංක 10 දරන දේශීය ආදායම් (සංශෝධන) පනතේ 57 වගන්තිය යටතේ වන මාර්ගෝපදේශ

2017 අංක 24 දරන දේශීය ආදායම් පනත සංශෝධනය සඳහා වූ 2021 අංක 10 දරන දේශීය ආදායම් (සංශෝධන) පනතේ 57 වගන්තිය යටත් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් හේරත් මුදියන්සේලාගේ විජය චන්ද්‍රතිලක බණ්ඩාර වන මම 2020 මාර්තු 31වන දිනෙන් අවසන් වන තක්සේරු වර්ෂය සඳහා (2019/2020) තනි පුද්ගලයන්, හවුල් ව්‍යාපාර සහ තනි පුද්ගලයන් සහ හවුල් ව්‍යාපාර නොවන වෙනත් තැනත්තන් විසින් ගෙවිය යුතු ආදායම් බද්ද ගණනය කිරීමේ කාර්යය සඳහා පිළිවෙළින් මෙහි 1 උපලේඛනය, 2 උපලේඛනය සහ 3 උපලේඛනයන්හි දක්වා ඇති මාර්ගෝපදේශ නිශ්චිත කරමි.

හේරත් මුදියන්සේලාගේ විජය චන්ද්‍රතිලක බණ්ඩාර,
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව,
කොළඹ 02,

1 උපලේඛනය

තනි පුද්ගලයන් විසින් ගෙවිය යුතු ආදායම් බද්ද ගණනය කිරීම සඳහා වූ මාර්ගෝපදේශය

(1) **තක්සේරු කළ හැකි ආදායම බෙදා වෙන් කිරීම**

තනි පුද්ගලයෙක් විසින් ඔහුගේ සේවා නියුක්ති ආදායම, ව්‍යාපාර ආදායම, ආයෝජන ආදායම සහ වෙනත් ආදායම 2019.04.01 සිට 2019.12.31 දක්වා වූ කාල සීමාව සඳහා (මින් පසු මෙම මාර්ගෝපදේශයන්හි "පළමු කාල සීමාව" ලෙස හඳුන්වන) සහ 2020.01.01 සිට 2020.03.31 දක්වා වූ කාල සීමාව සඳහා (මින් පසු මාර්ගෝපදේශයන්හි "දෙවන කාල සීමාව" ලෙස හඳුන්වන) මෙම උපලේඛනයේ 3 ඡේදයේ අ උපඡේදයේ නිශ්චිත කර ඇති ආකාරයට බෙදා වෙන් කර ගත යුතුය.

(2) **සහන සහ සුදුසුකම් ලබන ගෙවීම් සඳහා වු හිමිකම**

(අ) සහන

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ (මින් පසු මෙම මාර්ගෝපදේශයන්හි "දේශීය ආදායම් පනත" ලෙස හඳුන්වන) පස්වන උපලේඛනයේ 2 ඡේදයේ දක්වා ඇති පහත සඳහන් සහන අඩු කිරීමට තනි පුද්ගලයෙකු හිමිකම් ලබයි.

(i) දේශීය ආදායම් පනතේ පස්වන වන උපලේඛනයේ 2 ඡේදයේ (අ) උපඡේදය යටතේ තක්සේරු වර්ෂයක් සඳහා මුළු තක්සේරු කළ හැකි ආදායම (ආයෝජන වත්කම් උපලබ්ධිවීමෙන් ලැබෙන යම් ලැබීමක් හැර) දක්වා ලබා දී ඇති සහනය (පුද්ගලික සහනය), 2019/2020 තක්සේරු වර්ෂය සඳහා රු. 1,125,000 ක් [(500,000 x 9/12) + (3,000,000 x 3/12)] වේ.

(ii) දේශීය ආදායම් පනතේ පස්වන උපලේඛනයේ 2 ඡේදයේ (ආ) උපඡේදය යටතේ ලබා දී ඇති, 2019/2020 තක්සේරු වර්ෂය සඳහා තනි පුද්ගලයකුගේ සේවා නියුක්තික මුළු ආදායම දක්වා අඩු කළ හැකි සහනය (සේවා නියුක්ති සහනය), 2019 දෙසැම්බර් 31 දින දක්වා රු. 525,000 ක් (700,000 *9/12) වේ.

(iii) දේශීය ආදායම් පනතේ පස්වන උපලේඛනයේ 2 ඡේදයේ (ඇ) උපඡේදය යටතේ ලබා දී ඇති සහනය (කුලී සහනය) - 2019/2020 තක්සේරු වර්ෂය සඳහා මුළු කුලී ආදායමෙන් 25% ක ප්‍රමාණයක් වේ.

(iv) තනි පුද්ගලයා ජ්‍යෙෂ්ඨ පුරවැසියෙකු නම්, දේශීය ආදායම් පනතේ පස්වන උපලේඛනයේ දෙවන ඡේදයේ (ඈ) උපඡේදය යටතේ ලබා දී ඇති සහනය (ජ්‍යෙෂ්ඨ පුරවැසි පොලී සහනය), තක්සේරු වර්ෂයක් සඳහා රු. 1,500,000 ක්, වන අතර තනි පුද්ගලයෙකුට මූල්‍ය ආයතනයකින් 2019 දෙසැම්බර් මස 31 දින දක්වා වන කාල සීමාව සඳහා ව්‍යුත්පන්න වු සහ ව්‍යුත්පන්න වූ බවට සැලකන මුළු පොලී ආදායම දක්වා අදාළ වේ.

(v) වාසික පුද්ගලයෙකු හෝ හවුල් ව්‍යාපාරයක හවුල්කරුවකු විදේශ ව්‍යවහාර මුදලින් ආදායම් උපයන්නේ නම් සහ දේශීය ආදායම් පනතේ පස්වන උපලේඛනයේ දෙවන ඡේදයේ (ඉ) උපඡේදය යටතේ ලබා දී ඇති සහනයට (විදේශ සේවා සහනය) හිමිකම් ලබන්නේ නම්, එය, තක්සේරු වර්ෂයක් සඳහා රු. 15,000,000ක් වන අතර 2019 දෙසැම්බර් මස 31 දින දක්වා වන කාල සීමාව සඳහා වු එම මුළු ආදායම දක්වා අදළ වේ.

(vi) දේශීය ආදායම් පනතේ පස්වන උපලේඛනයේ දෙවන ඡේදයේ (ඊ) උපඡේදය යටතේ දී ඇති සහනය (වියදම් සහනය) - දෙවන කාල සීමාව සඳහා පහත සඳහන් වියදම් වල එකතුවේ රු. 300,000 ක් දක්වා වේ.

- වෛද්‍ය රක්ෂණ දායක මුදල ඇතුළුව සෞඛ්‍ය වියදම්
- යම් පුද්ගලයකු තමා වෙනුවෙන් හෝ ඒ පුද්ගලයාගේ දරුවන් වෙනුවෙන් දේශීයව දරන ලද වෘත්තීය අධ්‍යාපන හෝ වෙනත් අධ්‍යාපන වියදම්
- නිවාස ණය මත ගෙවන ලද පොලී
- සේවා යෝජකයකු යටතේ වු හෝ සේවා යෝජකයකු වෙනුවෙන් වු විශ්‍රාම යෝජනා ක්‍රමයකට හැර යම් දේශීය විශ්‍රාම යෝජනා ක්‍රමයකට සේවා නියුක්තිකයකු ගෙවන ලද දායක මුදල්
- කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කර ඇති සහ ශ්‍රී ලංකාවේ සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් බලපත්‍ර ලබා දී ඇති කොටස් හෝ වෙනත් යම් මුල්‍ය සාධනපත් හෝ ලියාපදිංචි ස්කන්ධ සහ සුරකුම්පත් ආඥා පනත (420 අධිකාරිය) යටතේ බැඳුම්කර හෝ දේශීය භාණ්ඩාගාර බිල් ආඥා පනත (417 අධිකාරිය) යටතේ භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම සඳහා දරන ලද වියදම්

දේශීය ආදායම් පනතේ විධිවිධානයන්ට යටත්ව, 2019/2020 තක්සේරු වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ වාසිකයෙකු වන තනි පුද්ගලයෙකුගේ බදු අය කළ හැකි ආදායම ගණනය කිරීමේදී ඉහත දැක්වු සමස්ත සහන අඩු කළ හැකිය . කෙසේ වෙතත්, නිර්වාසික නමුත් ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන තනි පුද්ගලයෙකුට ඔහුගේ බදු අය කළ හැකි ආදායම ගණනය කිරීමේදී ඉහත (i) අයිතමයේ දක්වා ඇති පුද්ගලික සහනය අඩු කළ හැකිය.

(ආ) සුදුසුකම් ලබන ගෙවීම්

(i) අනුමත පුන්‍යායතනයක් වෙත මුදලින් කරන ලද පරිත්‍යාග - තක්සේරු කළ හැකි මුළු ආදායමෙන් හතරෙන් එකකට යටත්ව (බද්දට යටත් ආදායමෙන් තුනෙන් එකක්) හෝ රු. 75,000 හෝ පරිත්‍යාග කරන ලද ප්‍රමාණය යන අගයන්ගෙන් අඩු අගය.

(ii) රජයට හෝ දේශීය ආදායම් පනතේ පස්වන උපලේඛනයේ දක්වා ඇති යම් විශේෂිත ආයතනයකට මුදලින් හෝ වෙනත් ආකාරයකින් කරන ලද පරිත්‍යාග.

(iii) 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනත අනුව පසුගිය තක්සේරු වර්ෂයක සිට ඉදිරියට ගෙන ආ, අඩු නොකරන ලද සුදුසුකම් ලබන ගෙවීම්වල යම් ශේෂයක්.

තනි පුද්ගලයකුගේ බදු අය කළ හැකි ආදායම ගණනය කිරීමේදී, 3 වන ඡේදයේ (ආ) වන උප ඡේදයේ නිශ්චිත කර ඇති ආකාරයට පළමු කාල සීමාවට හා දෙවන කාල සීමාවට අදාළව හිමිකම් ඇති සහන සහ සුදුසුකම් ලබන ගෙවීම් අඩු කළ හැකිය.

(3) **ගෙවිය යුතු ආදායම් බද්ද ගණනය කිරීම**

(අ) තක්සේරු කළ හැකි ආදායම බෙදා වෙන් කිරීම

(i) සේවා නියුක්ති ආදායම පළමු කාල සීමාව සහ දෙවන කාල සීමාව සඳහා සත්‍ය පදනම මත බෙදා වෙන් කළ යුතුය. (T 10 ආකෘතියේ දක්වා ඇති පරිදි දළ පාරිශ්‍රමිකය).

(ii) පොලී ආදායම පහත පරිදි විය යුතුය.

(iiඅ) අදාළ කාල සීමා සඳහා වු සත්‍ය ප්‍රමාණය මත හෝ

(iiආ) පළමු කාල සීමාව සඳහා මුළු පොලී ආදායමෙන් 3/4 ක් සහ දෙවන කාල සීමාව සඳහා මුළු පොලී ආදායමෙන් 1/4 ක් ලෙස සමානුපාතිකව බෙදීමෙන් හෝ

(iiiඇ) ජ්‍යෙෂ්ඨ පුරවැසියෙකු සම්බන්ධයෙන් වන විට, පළමු කාල සීමාව සඳහා ඉහත (iiආ) අනුව බෙදන ලද පොලී ආදායම රු. 1,500,000 ට වඩා අඩු වේ නම්, පළමු කාල සීමාව සඳහා වෙන් කළ යුතු පොලී ආදායම, තක්සේරු වර්ෂය සඳහා සත්‍ය වශයෙන් ලැබුණු ප්‍රමාණය (පළමු කාල සීමාවට හා දෙවන කාල සීමාවට) හෝ රු. 1,500,000 යන දෙකෙන් අඩු ප්‍රමාණය විය යුතු අතර, ඉතිරියක් වේ නම්,එය දෙවන කාල සීමාවට වෙන් කළ යුතුය.

(iii) ලාභාංශ, කුලී සහ අනෙකුත් ආයෝජන ආදායම් හෝ වෙනත් ආදායම් සත්‍ය පදනම මත බෙදිය යුතුය.

(iv) ව්‍යාපාර ආදායම, පළමු කාල සීමාව සඳහා මුළු ව්‍යාපාර ආදායමෙන් 3/4 ක් ලෙස සහ දෙවන කාල සීමාව සඳහා මුළු ව්‍යාපාර ආදායමෙන් 1/4 ක් ලෙසත් කාල සීමාව මත පදනම්ව සමානුපාතිකව බෙදිය යුතුය. යම් තනි පුද්ගලයකුට 2021 අංක 10 දරන දේශීය ආදායම් (සංශෝධන) පනතේ සංශෝධනයකට අනුව, දෙවන කාල සීමාව තුළ බදු නිදහස් වන යම් ප්‍රමාණයක් ලැබී හෝ ව්‍යුත්පන්න වී ඇත්නම්, වර්ෂය තුළ එම මුලාශ්‍රයෙන් ලද හෝ ව්‍යුත්පන්න වු මුළු ප්‍රමාණයෙන් 1/4 ක් බදු නිදහස් ප්‍රමාණය ලෙස සලකා ඉවත් කළ යුතු අතර, ඉතිරිය, මුළු ප්‍රමාණයෙන් 3/4 ක් වන ප්‍රමාණය, පළමු කාල සීමාව සඳහා හඳුනා ගත යුතුය. එම බදු නිදහස් ප්‍රමාණයෙන් අඩු කළ හැකි සහ දේශීය ආදායම් පනතේ වගන්ති 10(1)(ආ)(iv) යටතේ ඉඩ දිය නොහැකි වියදම් සහ අඩු කිරීම් ප්‍රමාණය එම මුළු වියදම් සහ අඩු කිරීම් ප්‍රමාණය කාල සීමාව මත පදනම්ව සමානුපාතිකය බෙදීමෙන් (පළමු කාල සීමාව සඳහා 3/4 ක් සහ දෙවන කාල සීමාව සඳහා 1/4 ක් ලෙස) හඳුනාගත යුතුය.

(ආ) සහන සහ සුදුසුකම් ලබන ගෙවීම් අඩු කිරිම ;

(i) සේවා නියුක්ති සහනය, පළමු කාල සීමාවට අදාළ සේවා නියුක්ති ආදායමෙන් පළමුව අඩු කළ යුතු අතර යම් අඩු නොකළ ශේෂයක් ඇත්නම් එම කොටස දෙවන කාල සීමාවට අදාළ සේවා නියුක්ති ආදායමෙන් අඩු කළ හැකිය.

(ii) ජ්‍යෙෂ්ඨ පුරවැසියෙකුට ව්‍යුත්පන්න වන පොලී ආදායම මත වන පොලී සහනය,රු. 1,500,000, අඩු කළ හැකි වන්නේ පළමු කාල සීමාවේදී පමණි.

(iii) විදේශ සේවා ආදායම මත වන විදේශ සේවා සහනය, රු. 15,000,000, අඩු කළ හැකි වන්නේ පළමු කාල සීමාවේදී පමණි.

(iv) මුළු කුලී ආදායමෙන් 25% ක් වන කුලී සහනය එක් එක් කාල සීමාව සඳහා අදාළ වන කුලී ආදායමෙන් අඩු කළ හැකිය.

(v) වියදම් සහනය අඩු කළ හැකි වන්නේ දෙවන කාල සීමාවේදී පමණි.

(vi) 2019/2020 තක්සේරු වර්ෂය සඳහා අඩු කළ හැකි පුද්ගලික සහනය රු. 1,125,000 වේ. කෙසේ වෙතත්, පළමු කාල සීමාව සහ දෙවන කාල සීමාව සඳහා පිළිවෙලින් අදාළ වන රු. 375,000 ක සහ රු. 750,000 ක ප්‍රමාණ, එම කාල සීමා සඳහා අදාළ වන තක්සේරු කළ හැකි ආදායමේ කොටසින් අඩු කළ යුතුය. යම් අඩු නොකළ කොටසක් වේ නම් එම කොටස අනෙක් කාල සීමාවේ ඉතිරි තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කළ හැකිය.

කෙසේ වෙතත්,

(viඅ) දෙවන කාල සීමාවට අදාළ අඩු නොකළ පුද්ගලික සහනය, දැනටමත් උපයන විට ගෙවීමේ බද්ද අඩු කරන ලද සේවා නියුක්ති ආදායමෙන් අඩු නොකළ යුතුය.

(viආ) පළමු කාල සීමාවේ ආදායම අවසාන රඳවා ගැනීමේ ගෙවීමක් හෝ දෙවන කාල සීමාවේ ආදායම නිදහස් ආදායමක් වීම නිසා අදාළ සහනය අඩු කළ නොහැකි වූයේ නම්, එම අඩු නොකළ සහනය නොසලකා හැරිය යුතුය

(vii) බදු අය කළ හැකි ආදායම ගණනය කිරීමේදී, සුදුසුකම් ලබන ගෙවීම් ඕනෑම කාල සීමාවකදී අඩු කළ හැකිය. කාල සීමා දෙක සඳහා ආදළ වන සහන අඩු කිරීමෙන් පසු ලැබෙන තක්සේරු කළ හැකි ආදායම් එකතු කිරීමෙන් මුළු තක්සේරු කළ හැකි ආදායමට ගණනය කළ හැක.

(ඇ) පළමු කාල සීමාව සහ දෙවන කාල සීමාව සඳහා වෙන වෙනම ආදායම් බදු අනුප්‍රමාණ අදාළ කර ගන්න.

(ඈ) ගෙවිය යුතු ආදායම් බද්ද, කාල සීමා දෙක සඳහා අදාළ වන බදු අනුප්‍රමාණ (පස්වන ඡේදය) යොදා ගනිමින් ගණනය කළ යුතුය.

(4) **සමස්ත සහන අඩු කිරීමෙන් ඇති වන ආපසු ගෙවීම් සහ ගෙවිය යුතු ප්‍රමාණ**

පළමු කාල සීමාව සඳහා පවතින බදු නීතිය අනුව නිවැරදිව බද්ද ගණනය කළද, තක්සේරු වර්ෂය සඳහා සමස්ත සහනය වන රු. 1,650,000 (525,000 + 1,125,000) අඩු කිරීම නිසා පළමු කාල සීමාව තුළදී ඇති වන ආපසු ගෙවීම් ප්‍රමාණයක් හෝ ගෙවිය යුතු ප්‍රමාණයක් නොසලකා හැරිය යුතුය.

(5) **වාසික සහ නිර්වාසික පුද්ගලයින් සඳහා අදාළ වන බදු අනුප්‍රමාණ**

අ. සාමාන්‍ය අනුප්‍රමාණ

(i) පළමු කාල සීමාව

| *බදු අය කළ හැකි ආදායම* | *බදු අනුප්‍රමාණ* |
|---|---|
| පළමු 450,000 මත | 4% |
| ඊළඟ 450,000 මත | 8% |
| ඊළඟ 450,000 මත | 12% |
| ඊළඟ 450,000 මත | 16% |
| ඊළඟ 450,000 මත | 20% |
| ඉතිරිය මත | 24% |

(ii) දෙවන කාල සීමාව

| බදු අය කළ හැකි ආදායම | බදු අනුප්‍රමාණ |
|---|---|
| පළමු 750,000 මත | 6% |
| ඊළඟ 750,000 මත | 12% |
| ඉතිරිය මත | 18% |

ආ. විශේෂ අනුප්‍රමාණ

2019/2020 තක්සේරු වර්ෂය සඳහා-
ඔට්ටු ඇල්ලීමේ සහ සූදු ව්‍යාපාරයකින්, මත්පැන් හෝ දුම්කොළ නිෂ්පාදන, නිෂ්පාදනය කර විකිණීමේ හෝ ආනයනය කර විකිණීමේ ව්‍යාපාරයකින් ලැබෙන ආදායම මත බද්ද - 40%

2 උපලේඛනය

**හවුල් ව්‍යාපාර විසින් ගෙවිය යුතු ආදායම් බද්ද ගණනය කිරීම සඳහා වූ මාර්ගෝපදේශය**

(1) 2020.01.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, හවුල් ව්‍යාපාරයක් එහි බදු අය කළ හැකි ආදායම (ආයෝජන වත්කම් උපලබ්ධිවීමෙන් ලැබෙන යම් ලැබීමක් ද ඇතුළුව) මත ආදායම් බදු ගෙවීමට යටත් වේ. කෙසේ වෙතත්, තක්සේරු වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයක යම් ආයෝජන වත්කමක් උපලබ්ධිවීමෙන් ලැබෙන ලැබීමක් මත ආදායම් බදු බැඳියාව දේශීය ආදායම් පනතේ දක්වා ඇති පරිදි ගණනය කළ යුතුය (අදාළ විධිවිධාන සඳහා සංශෝධන සිදු කර නොමැත).

(2) 3 වන ඡේදයේ සඳහන් කොන්දේසිවලට යටත්ව, සියළුම හවුල් ව්‍යාපාර, තක්සේරු වර්ෂය සඳහා තම තක්සේරු කළ හැකි ආදායම (ආයෝජන වත්කම් උපලබ්ධිවීමෙන් ලැබෙන යම් ලැබීමක් හැර) ගණනය කල යුතු අතර එම ආදායම, පළමු කාල සීමාව සහ දෙවෙනි කාල සීමාව ලෙස කාල සීමාව මත පදනම්ව කාල සීමා දෙකට සමානුපාතිකව (පළමු කාල සීමාව සඳහා 3/4 ක් සහ දෙවන කාල සීමාව සඳහා 1/4 ක් ලෙස) බෙදිය යුතුය

කෙසෙවෙතත්, හවුල් ව්‍යාපාරයට 2021 අංක 10 දරන දේශීය ආදායම් (සංශෝධන) පනතේ සංශෝධන අනුව, දෙවන කාල සීමාව තුළ බදු නිදහස් වන යම් ප්‍රමාණයක් ලැබී හෝ ව්‍යුත්පන්න වී ඇත්නම්,එම මූලාශයෙන් වර්ෂය තුළ ලද හෝ ව්‍යුත්පන්න වූ මුළු ප්‍රමාණයෙන් 1/4 ක් බදු නිදහස් ප්‍රමාණය ලෙස සලකා ඉවත් කළ යුතු අතර, ඉතිරිය, මුළු ප්‍රමාණයෙන් 3/4 ක් වන ප්‍රමාණය,පළමු කාල සීමාව සඳහා හඳුනා ගත යුතුය. එම බදු නිදහස් ප්‍රමාණයෙන් අඩු කළ හැකි සහ දේශීය ආදායම් පනතේ වගන්ති 10(1)(ආ)(iv) යටතේ ඉඩ දිය නොහැකි වියදම් සහ අඩු කිරීම් ප්‍රමාණය එම මුළු වියදම් සහ අඩු කිරීම් ප්‍රමාණය කාල සීමාව මත පදනම්ව සමානුපාතිකය බෙදීමෙන් (පළමු කාල සීමාව සඳහා 3/4 ක් සහ දෙවන කාල සීමාව සඳහා 1/4 ක් ලෙස) හඳුනාගත යුතුය.

(3) හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවන් තනි පුද්ගලයන් වේ නම්, එවිට, පළමු කාල සීමාව තුළ ලද හෝ ව්‍යුත්පන්න වූ සත්‍ය පොලීය හා ලාභාංශ අවසාන රඳවා ගැනීමේ ගෙවීම් ලෙස ඉවත් කිරීමට හවුල් ව්‍යාපාරවලට ඉඩ දෙනු ලැබේ. එවැනි අවස්ථාවක, දෙවන කාල සීමාවේදී ලැබී හෝ ව්‍යුත්පන්න වී ඇති සත්‍ය පොළී ආදායම සහ සත්‍ය ලාභාංශ ආදායම බෙදා වෙන් කිරීම අවශ්‍ය නොවන අතර එම ආදායම් දෙවන කාල සීමාව සඳහා හවුල් ව්‍යාපාරයේ බදු වන ආදායමක් ලෙස සැලකිය යුතුය. එම ආදායම්වල හවුල්කරුගේ කොටස ( තක්සේරු වර්ෂය සඳහා වන මුළු පොළී හා ලාභාංශ කොටස) එක් එක් හවුල්කරු ගෙවිය යුතු බදු ප්‍රමාණය ගණනය කිරීමේ කාර්යය සඳහා ඇතුලත් කිරීමේදී 1 උපලේඛනයේ සඳහන් මාර්ගෝපදේශය අනුගමනය කිරීම අවශ්‍ය වේ.

හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවන් සමාගම් වේ නම්, ඉහත උපදෙස් ( 3 ඡේදයේ සඳහන්) ලාභාංශ සඳහා පමණක් අදාළ වේ.

(4) දේශීය ආදායම් පනතේ විධිවිධානයන්ට යටත්ව, බදු වන ආදායම ගණනය කිරීමේදී දෙවන කාල සීමාවේදී කරන ලද සුදුසුකම් ලබන ගෙවීම් අඩු කිරීමට හවුල් ව්‍යාපාරය හිමිකම් ලබයි.

(5) හවුල් ව්‍යාපාරයක බදු වන ආදායම (ආයෝජන වත්කම් උපලබ්ධිවීමෙන් ලැබෙන යම් ලැබීමක් හැර) මත ගෙවිය යුතු ආදායම් බද්ද (දෙවන කාල සීමාව සඳහා) පහත දක්වා ඇති අදාළ බදු අනුප්‍රමාණ යොදා ගනිමින් ගණනය කල යුතුය.

| *බදු අය කළ හැකි ආදායම* | *බදු අනුප්‍රමාණය* |
|---|---|
| පළමු 250,000 | 0 |
| ඉතිරිය | 6% |

(6) පළමු කාල සීමාව තුළදී හවුල් ව්‍යාපාරය විසින් හවුල් ව්‍යාපාර ආදායමෙන් යම් කොටසක් හවුල්කරුවන් වෙත වෙන් කර ඇත්නම්, දේශීය ආදායම් පනතේ 84(1)(අ)(ii) වගන්තියෙහි දක්වා ඇති පරිදි එම වෙන් කරන ලද කොටස මත රඳවා ගැනීමේ බද්ද ගෙවිය යුතුය.(එම රඳවා ගැනීමේ බද්ද, දේශීය ආදායම් පනතේ 86 වගන්තියෙහි දක්වා ඇති පරිදි ගෙවිය යුතු අතර ප්‍රමාද ගෙවීම් පොලී හා දඩ අය කිරීමට හේතු වේ). එසේ නොමැති නම්, දේශීය ආදායම් පනතේ කාර්ය සඳහා, තක්සේරු වර්ෂය අවසානයේදී හවුල් ව්‍යාපාර ආදායම වෙන් කිරීම සිදු වන අතර හවුල් ව්‍යාපාර ආදායමේ එම කොටස මත රඳවා ගැනීමේ බදු බැඳියාවක් ඇති නොවේ.

(7) ඉහත 3 ඡේදයේ සඳහන් කොන්දේසිවලට යටත්ව, හවුල් ව්‍යාපාරයක හවුල්කරුවකුගේ ආදායම් බදු බැඳියාව ගණනය කිරීමේදී, හවුල්කරුට හවුල් ව්‍යාපාර ආදායමෙන් ලද කොටස (අලාභ ඇතුළුව) හා සුදුසුකම් ලබන ගෙවීම් වලින් අදාළ වන යම් කොටසක් අවස්ථානුකූලව ඇතුළත් කිරීම හෝ අඩු කිරීම කළ යුතු අතර හවුල්කරුවකුගේ බදු වන ආදායම තක්සේරු වර්ෂයේ අදාළ කාල සීමා දෙක සඳහා වෙන වෙනම ගණනය කළ යුතුය. පළමු කාල සීමාව සඳහා හවුල්කරුවකුට හිමි අවසානාත්මක නොවන රඳවා ගැනීමේ බදු (හවුල් ව්‍යාපාර ආදායම් කොටස මත රඳවා ගැනීමේ බද්ද ගෙවා ඇත්නම් එයද ඇතුළුව) හෝ යම් බදු බැරක් අදාළ ආදායම් බදු බැඳියාවෙන් අඩු කළ හැකි අතර එම බදු බැර මත ආපසු ගෙවීමක් ඇත්නම් (සංශෝධනයන්ට පෙර දේශීය ආදායම් පනතේ අදාළ විධිවිධානයන්ට යටත්ව) ඉල්ලා සිටිය හැකිය. හවුල් ව්‍යාපාරය, වාරිකයක් ලෙස හවුල් ව්‍යාපාර ආදායම මත ගෙවන ලද ආදායම් බද්ද, දෙවන කාල සීමාව සඳහා හවුල් ව්‍යාපාර ආදායම් කොටස මත පදනම්ව හවුල්කරුවන් වෙත වෙන් කළ යුතු අතර එය හවුල්කරුට බදු බැරක් ලෙස සැලකිය යුතුය. හවුල්කරුගේ ගෙවිය යුතු බද්ද ගණනය කිරීමේදී, හවුල් ව්‍යාපාර ආදායම් බද්දේ අදාළ කොටස අඩු කිරීමෙන් පසු යම් අතිරික්ත බදු බැරක් ඇත්නම් එය ආපසු ගෙවීමක් ලෙස ලබා නොදෙන අතර එම අතිරික්ත බදු බැර ඉදිරියට ගෙන යාමට හවුල්කරුට ඉඩ දෙනු ලැබේ.

## 3 *උපලේඛනය*

## තනි පුද්ගලයන් හා හවුල් ව්‍යාපාර නොවන වෙනත් තැනැත්තන් විසින් ගෙවිය යුතු ආදායම් බද්ද ගණනය කිරීම සඳහා වූ මාර්ගෝපදේශය

(1) පහත උපදෙස් අනුගමනය කිරීමේ කාර්යය සඳහා, සමාගමක් යන්නට සංස්ථාවක්, සමාජ ශාලාවක්/සංගමයක්, රාජ්‍ය නොවන සංවිධානයක්, පුන්‍යායතනයක්, අරමුදලක්, භාරයක් හෝ ඒකක භාරයක් සහ හවුල් ව්‍යාපාර නොවන අස්ථිත්වයක් ඇතුලත් වේ.

(2) සමාගම විසින් තක්සේරු වර්ෂය සඳහා එහි තක්සේරු කළ හැකි ආදායම සහ බදු අය කළ හැකි ආදායම, පළමු කාල සීමාව සහ දෙවන කාල සීමාව ලෙස කාල සීමා දෙකට වෙන් කිරීමකින් තොරව ගණනය කළ යුතුය.

(3) 2021 අංක 10 දරන දේශීය ආදායම් (සංශෝධන) පනතේ සංශෝධනයකට අනුව, දෙවන කාල සීමාව තුළ බදු නිදහස් වන යම් ප්‍රමාණයක් සමාගමට ලැබී හෝ ව්‍යුත්පන්න වී ඇත්නම්, තක්සේරු වර්ෂය සඳහා බදු අය කළ හැකි ආදායම ගණනය කිරීමේදී එම මූලාශ්‍රයෙන් වර්ෂය තුළදී උපයන ලද මුළු වටිනාකමින් 1/4 ක ප්‍රමාණයක් නිදහස් ප්‍රමාණය ලෙස සලකා ඉවත් කළ හැකිය. එම ප්‍රමාණයෙන් ඉතිරි ප්‍රමාණය (බදු සඳහා ගලපන ලද ලැබීම් සහ ලාභ), මුළු ප්‍රමාණයෙන් 3/4 ක් වන ප්‍රමාණය, පළමු කාල සීමාව සඳහා හඳුනා ගත යුතුය. පළමු කාල සීමාවේදී ලැබී හෝ ව්‍යුත්පන්න වී ඇති සත්‍ය ලාභාංශ ආදායමද අවසාන රඳවා ගැනීමේ ගෙවීම් ලෙස ඉවත් කළ හැකිය. එවැනි නිදහස් ප්‍රමාණ සහ අවසාන රඳවා ගැනීමේ ගෙවීම් වලින් අඩු කළ හැකි සහ දේශීය ආදායම් පනතේ 10(1)(ආ)(iv) වගන්තිය යටතේ අඩු කිරීමට ඉඩ නොදෙන වියදම් සහ ඒ සම්බන්ධ අඩු කිරීම් ප්‍රමාණය, එම මුළු වියදම් සහ අඩු කිරීම් ප්‍රමාණය කාල සීමාව මත පදනම්ව සමානුපාතිකය බෙදීමෙන් (පළමු කාල සීමාව සඳහා 3/4 ක් සහ දෙවන කාල සීමාව සඳහා 1/4 ක් ලෙස) හඳුනාගත යුතුය.

(4) ඉහත 3 ඡේදයේ සඳහන් උපදෙස් අනුව ගණනය කරන ලද බදු අය කළ හැකි ආදායම කාල සීමා දෙකට කාලය මත පදනම්ව සමානුපාතිකව (පළමු කාල සීමාව සඳහා 3/4 ක් සහ දෙවන කාල සීමාව සඳහා 1/4 ක් ලෙස) බෙදා ගත යුතුය.

කෙසේ වෙතත්, දෙවන කාල සීමාවේදී ලැබී හෝ ව්‍යුත්පන්න වී ඇති සත්‍ය ලාභාංශ ආදායම බෙදා වෙන් කිරීම අවශ්‍ය නොවන අතර එය දෙවන කාල සීමාව සඳහා අදාළ බදු අය කළ හැකි ආදායමක් ලෙස සැලකිය යුතුය.

(5) ව්‍යාපාරයෙන් හෝ යම් විශේෂිත ආයෝජනයකින් අලාභ ඇත්නම්, සමාගමක් දේශීය ආදායම් පනතේ 19 වන වගන්තිය යටතේ අලාභ අඩු කිරීමේ කාර්යය සඳහා එහි තක්සේරු කළ හැකි ආදායම ඒ ඒ ව්‍යාපාරයට හෝ ආයෝජනයට අවස්ථානුකූලව වෙන වෙනම ( 2, 3 සහ 4 ඡේදයන්හි මාර්ගෝපදේශවල කුමක් සඳහන් වුවද) ගණනය කළ යුතුය. එවැනි අවස්ථාවක, එක් එක් ක්‍රියාකාරකමෙන් ලැබෙන ව්‍යාපාර ආදායම, ආයෝජන ආදායම හෝ අලාභ කාලය මත පදනම්ව සමානුපාතිකව පළමු කාල සීමාව සඳහා 3/4 ක් සහ දෙවන කාල සීමාව සඳහා 1/4 ක් ලෙස බෙදා ගත යුතුය. දේශීය ආදායම් පනතේ විධිවිධානයන්ට යටත්ව ඉඩ දිය හැකි අලාභ අඩු කරමින් මුළු තක්සේරු කළ හැකි ආදායම කාල සීමා දෙකට වෙන වෙනම ගණනය කළ යුතුය. ගෙවිය යුතු ආදායම් බද්ද ගණනය කිරීමේදී බදු අනුප්‍රමාණ අදාළ පරිදි යොදා ගැනීමට බදු අයකළ හැකි ආදායමද කාල සීමා දෙකට වෙන වෙනම ගණනය කළ යුතුය.

(6) සමාගමක් විසින් තම බදු අය කළ හැකි ආදායම මත ගෙවිය යුතු ආදායම් බද්ද, කාල සීමා දෙකට වෙන වෙනම අදාළ බදු අනුප්‍රමාණ යොදා ගනිමින් ගණනය කළ යුතුය. ඒ අනුව, පළමු කාල සීමාව සඳහා සංශෝධනයන්ට පෙර දේශීය ආදායම් පනතේ දක්වා ඇති බදු අනුප්‍රමාණ අදාළ කර ගත යුතු අතර දෙවන කාල සීමාව සඳහා 2021 අංක 10 දරණ දේශීය ආදායම් (සංශෝධිත) පනතේ සඳහන් කර ඇති බදු අනුප්‍රමාණ අදාළ කර ගත යුතුය

(7) පළමු කාල සීමාව සඳහා දේශීය ආදායම් පනතේ පළමු උපලේඛනයේ 4 වන ඡේදයේ 2 වන උපඡේදයේ අයිතම (ආ), (ඇ), (ඉ), (ඊ) සහ (උ) යටතේ දක්වා ඇති විශේෂ අනුප්‍රමාණ අදාළ කර ගැනීම සඳහා අවශ්‍යවන "මූලික" පදනම, පළමු කාල සීමාව සඳහා වූ සත්‍ය දළ ආදායම මත පදනම්ව ගණනය කළ යුතුය.

(8) 2019/2020 තක්සේරු වර්ෂය සඳහා සමාගමේ ගෙවිය යුතු බද්ද ගණනය කිරීමේ දී, දේශීය ආදායම් පනතේ විධිවිධාන වලට යටත්ව ප්‍රදානය කර ඇති හෝ ඉඩ දී ඇති විදේශීය බදු බැර, අවසානාත්මක නොවන රඳවා ගැනීමේ බදු බැර සහ අනෙකුත් බදු බැර මුළු ගෙවිය යුතු බද්දෙන් අඩු කළ හැකිය

(9) යම් සමාගමකට අප්‍රේල් 01 සිට මාර්තු 31 දක්වා වන කාල සීමාව හැර වෙනත් මාස දොළහක කාල සීමාවක් සඳහා ගිණුම් ප්‍රකාශ සකස් කිරීමට සහ 2019/2020 තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු ආදායම් බදු ප්‍රමාණය ගණනය කිරීමට කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය හිමි වී ඇත්නම් ඉහත දැක්වූ උපදෙස්, 2020.01.01 දිනට පෙර කාල සීමාව (පළමු කාල සීමාව) සහ 2020.01.01 දින හෝ එදිනට පසු කාල සීමාව (දෙවන කාල සීමාව) ලෙස ගිණුම්හි අදාළ කාල සීමා දෙකට යෝග්‍ය පරිදි අදාළ කර ගත යුතුය. ඒ අනුව, ගිණුම් වර්ෂයේ ආරම්භක දිනයේ සිට 2019.12.31 දින දක්වා මාස ගණන පළමු කාල සීමාව වන අතර 2020.01.01 දින සිට ගිණුම් වර්ෂය අවසාන දිනය දක්වා මාස ගණන දෙවන කාල සීමාව වේ.

(10) පළමු කාල සීමාවේදී ලැබී හෝ ව්‍යුත්පන්න වී ඇති සත්‍ය පොළී ආදායමද අවසාන රඳවා ගැනීමේ ගෙවීම් ලෙස ඉවත් කිරීමට පුනාායතනවලට ඉඩදෙනු ලැබේ. එවැනි අවසාන රඳවා ගැනීමේ ගෙවීම් වලින් අඩු කළ හැකි සහ දේශීය ආදායම් පනතේ 10(1)(ආ)(iv) වගන්තිය යටතේ අඩු කිරීමට ඉඩ නොදෙන වියදම් සහ ඒ සම්බන්ධ අඩු කිරීම් ප්‍රමාණය, එම මුළු වියදම් සහ අඩු කිරීම් ප්‍රමාණය කාල සීමාව මත පදනම්ව සමානුපාතිකය බෙදීමෙන් (පළමු කාල සීමාව සඳහා 3/4 ක් සහ දෙවන කාල සීමාව සඳහා 1/4 ක් ලෙස) හඳුනාගත යුතුය. දෙවන කාල සීමාවේදී ලැබී හෝ ව්‍යුත්පන්න වී ඇති සත්‍ය පොළී ආදායම බෙදා වෙන් කිරීම අවශ්‍ය නොවන අතර එය දෙවන කාල සීමාව සඳහා අදාළ බදු අය කළ හැකි ආදායමක් ලෙස සැලකිය යුතුය.

06 - 282

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.